Vidyodaya J. Arts, Sci.. Lett., Vol. 10 No. 1 & 2. January - July, 1982 pp. 81-93

# සම්භාවනීය ඉතිහාසඥයන් නොමග යැවූ ගැටළුවක්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ
**විමල විජයසූරිය**
විසිනි

අනුරාධපුර අග භාගය පිළිබඳ ඓතිහාසික තොරතුරු වංස කථාවලට ඇතුළුව ඇත්තේ අතිසංක්ෂිප්තව ය. පාණ්ඩ්‍ය චෝල ආදී දක්ෂිණ භාරතීය ආක්‍රමණ මුල්වීමෙන් ශාස්ත්‍රාගම පරිහානියට පත් අඳුරු කාල පරිච්ඡේදයකට පසු පොළොන්නරු අග භාගය තරම් පසුව ඒ කරුණු චූලවංසයට ඇතුළු කිරීමට සිදුවීමෙන් වූ අමතක වීම් නිසා එක්කෝ එසේ සංක්ෂිප්ත වුණා විය හැකිය. නැතහොත් චූලවංසයෙහි මහාපරාක්‍රමබාහු චරිතාපදනයට වැඩි සැලකිල්ලක් හෝ අවකාශයක් වෙනුවෙන් මේ කරුණු නො සලකා හැරියා වීමට ද පුළුවන.

මේ කාලපරිච්ඡේදය ගැන ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසයේ ප්‍රථම කාණ්ඩයේ ප්‍රථම භාගයේ ලා මහාචාර්ය එල්. එස්. පෙරේරා මෙසේ කියයි.

"Although the Culavamsa invariably gives the relationship of each king to his predecessor, for the six rulers from Dappula iii. to Sena iv. it is for once strangely silent"[1].

මේ යුගයේ බොහෝ ඓතිහාසික කරුණු ගැන මෙන් ම රජ පෙළපත ගැන වුව ද, ක්‍රමවත් සම්බන්ධයක් චූලවංසයෙන් මතුකර ගත නොහැකි බව මෙසේ ඉතිහාසඥයන් විසින් පිළිගෙන ඇත. එහෙයින් මේ යුගය අවබෝධ කර ගැනීමට (චූ.ව. කෙටි තොරතුරුවලට අමතරව) අපට ප්‍රධාන සාධක ලබා ගත හැක්කේ වරින් වර සොයා ගනු ලැබූ සෙල් ලිපිවලිනි.

IV. මහින්ද රජතුමා අනුරාධපුර අග භාගයට අයත් ඉතිහාසයෙහි ලා උසුලනුයේ අතිශයින් ම වැදගත් ස්ථානයකි. ලංකාවේ ස්වාධිපත්‍යයට එරෙහි ව නැඟී ආ අන්තර් ද්වීපික රාෂ්ට්‍රකූට, චෝල ආදී දක්ෂිණ භාරතීය අතිබලවත් ශත්‍රු අධිරාජයන් ගේ ව්‍යාප්තිමය බලය[2] මර්දනය කිරීම සඳහා සාර්ථක ව තම යුද්ධ ශක්තිය සංවිධානය කළ වීර සිංහල නරේන්ද්‍රයන් දෙ තුන්දෙනා ගෙන් කෙනෙකි, මොහු. අනුරාධපුර අග භාගයේ ලංකා ඉතිහාසය බබුළුවන II. සේන, V. කාශ්‍යප හා IV. මහින්ද යන තුන් මහ රජවරුන් ගෙන් IV. මහින්දට විශේෂ ස්ථානයක් හිමිවන්නේ මේ නිසා ය.

---

1. History of Ceylon, University of Ceylon [UHC] 1959, i-i p. 334.
2. මහාවංසො [මව.], පොල්වත්තේ බුද්ධදත්ත සං. 1959, 51. 44-45 (චූලවංසය [චූව.] ද මේ සංස්කරණය තුළ "මහාවංස" නමින් ම ප්‍රකාශිත ය.)

   "ගතො සෙනාපතී තත්ථ යුජ්ඣිත්වාන රඤ්ඤො මතො
   මකුටාදීනි ආදය රාජා සො රොහණං ගතො" (44)
   ගන්ත්වා චොල බලං තත්ථ අලභිත්වා පවෙසනං
   නිවත්තිත්වා සකං රට්ඨං අගමාසි ඉතො භයා "(45)

   UHC. i-i, p. 346.

   Cholas-K. A. Nilakanta Sastri p. 186.

IV. උදය (946-954) රාජ්‍යෝදය තුළ මොනු රුහුණේ මිහිඳු ඇපා ව සිටිය දී[3] II. රාජසිංහ මාරවර්මන් (පාණ්ඩ්‍ය) (905-20) රජු ගේ රාජාභරණ ආපසු ලබා ගැනීමට අනුරපුර මහරජය ද යටත්කොට රෝහණයට ඒවීසීමට ආ I. පරාන්තක ගේ ජයග්‍රාහී චෝල බලය පසු බැස්වීමත්[4] යළිත් පාණ්ඩ්‍ය දේශය ද යටත් කොට, ලංකාව කරා ද ආක්‍රමණය මෙහෙයවමින් ඌරාතොටට (කයිට්ස්) බට II. පරාන්තක ගේ[5] නො වේ නම්, III. රාෂ්ට්‍රකූට කෘෂ්ණ ගේ[6] බලය සෙන්පති කුඩුම්බාලූර් ශිරියවේලාර් ද මරා දමමින්, ''සෙන් සෙනෙවි රදුන්'' ලවා සාර්ථක ලෙස මැඩලීමත්[7] යන පිළිගත් ඓතිහාසික සාධක මත යි, ඔහුට ඒ ශ්‍රෙෂ්ඨත්වය හිමිවන්නේ. මෙසේ ලංකා සහ භාරත සෙල් ලිපිවලත්, වංස කථාවලත් එන මේ යුගය හා සම්බන්ධ රාජ්‍ය හා ආගමික කටයුතු පිළිබඳ පිළිගත් සටහන්වලින් පෙනෙන්නේ, IV. මිහිඳුගේ සොළොස් වස් රජය ලක් ඉතිහාසයෙහි අති-දීප්තිමත් නවෝදයක් පෙන්වන්නක් බව ය.

එහෙත්, වර්තමාන සම්භාව්‍ය ඉතිහාසඥයන් බොහෝ දෙනා අතින් පවා මේ යුගයේ ලංකා ඉතිහාසය ලියවී ඇත්තේ වඩාත් නොසැලකිලිමත් ලෙසත්, ව්‍යාකූල ලෙසත් නිසා, එයට අයත් ඉතා වැදගත් ගැටළු රැසක් ම විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය ආදී කෘතීන් දෙස බලන විට තවමත් නො විසඳී ඇති බව යි, පෙනෙන්නේ[3]. එයින් විශේෂයෙන් මෙහි විමසුමට භාජන වන්නකි, V, කාශ්‍යප මහරජු IV. මිහිඳු රජු ගේ පියා ය'' යන්න. මෙහි මතු විසඳෙන අයුරු ''V කාශ්‍යප පමණක් නො ව IV. දප්පුල, III. උදය, IV. උදය සහ IV. සේන ඈ රජුන් ගෙන් ද අයකු අනුරාධපුර අග භාගයේ ශ්‍රෙෂ්ඨතම නරවීරයා වූ IV. මිහිඳු රජු ගේ පියා විය හැකි ය'' යන විවිධ මත මෙකල පිළිගත් ඉතිහාසඥයන් විසිනුත් ලියා ඇත.[9]

කෙසේ වුවත්, එම යුගයේ ලංකාව ආක්‍රමණය කිරීමට ආ මහාධිරාජ්‍යයන් දෙකක් හමුවේ මාතෘ භූමියේ ස්වාධිපත්‍යයත්, ජාතියේ ආත්ම ගරුත්වයත් අපට අභීත ව ආරක්ෂා කරදී අනුරපුර රජයේ අවසාන වරට ලක එක සේසත් කළ මේ ජාතික මහා වීරයාණන් පිළිබඳ ඉතා වැදගත් ඓතිහාසික ගැටළු කීපයක් විසඳා ගැනීමට යත්න දැරීම ජාතියේ යුතුකමකි.

---

3. Epigraphia Zeylanica [EZ] Vol. i.i, pp. 222-3
4. Epigraphia Indica [EI,], Vol. viii, p. 01
   Ceylon Historical Journal. [CHJ.] iv. p. 13
   A History of South India [H.S.I.] Nilakanta Sastri, 1966, p. 176
5. Cholas -i, p. 186
   මේ ආක්‍රමණිකයා ii. පරාන්තක චෝල ලෙස ශාස්ත්‍රී සිතයි.
6. CHJ. W.-p, 13.
   බසාම් කියන්නේ iii. රාෂ්ට්‍රකූට කෘෂ්ණ රජු ලෙස ය. පරණවිතාන ද පිළිගන්නේ දෙවන අදහසයි. (Ceylon and Malaysia. [Cm.] p. 39)
7. EZ. Vol. i. p. 31. ''සෙන් සෙනෙවි වික්මෙන් මුළු දම්බදිවහි ස [s] විසිඇ තුමා පාමිලි කළ....[6]''
   මව. 52. 12-14
   ''බලකායං ඉමං දෙසං මද්දනත්ථාය වල්ලභො..........
   බලං දත්වාන සෙනව්හ රාජ සෙනාපතිං තදා............
   ගන්ත්වා සෙනාපතිං තත්ථ ........යුජ්ක්ධිත්වා තං විනාසෙත්වා................''
   පූජාවලිය [පූව.] ඇ. තෙන්නකෝන්, 1965, 796 පිට
   ''කුඩා මිදෙල් රජ සොළී රටින් හූරාතොටට බට දෙමළ රජකු හා මහසෙනඟක් සාධා සොළොස් හවුරුද්දක් රජ කළේ ය.''
   UHC. i-i. p. 347
   South Indian Inscriptions [SII.], Nilakanta Sastri, v. p. 980 (ii. (පරාන්තකගේ 9. වර්ෂය)
   Ceylon Antiquary, [CA.] iv, Pt i, p. 35
8. UHC. i-i, pp. 336-339
9. UHC. i-i. p. 339

පුහුණු මුල් ම ලංකා සෙල් ලිපි විද්‍යාඥයා ලෙස 1874 දී පත්වූ පී. ගෝල්ඩ්ස්මිත් මිහින්තලා ලිපියේ **''සිරිසඟබොය් අබහය්''** යනු IV. මහින්ද රජු ලෙස හඳුනා ගනී. එ රජුගේ දෙමව්පියන් ලෙස එහි සඳහන් **''අභාසලංමෙවන් මහරජ්''** සහ **''දෙව්ගොන් බිසෙව් රැජ්න''** මයිලගස්තොට ලිපියේ **''අභාසලමෙවන් මහ රද්හු''** සහ **''ගොන් බිසෝ''** යයි කියවා, එම ලිපි දෙකෙහි ම ප්‍රතිෂ්ඨාපකයා එක් අයකු හෙවත් IV. මහින්ද ලෙස තීරණය කරයි.[10]

ඔහුට පසුව එම ධුරයට පත් වූ **එඩ්වඩ් මියුලර්** ද එය අනුමත කරයි. එහෙත් **මියුලර්** මේ ලිපියේ ''සඟ'' යන්න ''සිටි'' යයි කියවා **''ගොන් බිසෝ''** යනු ම මව් බිසොව ගේ ශුද්ධ නාමය ලෙස පිළිගනී.[14].

මිහින්තලා පුවරු ලිපි ලංකා ශිලා ලේඛන සංග්‍රහයෙහි ලා මුද්‍රණ ද්වාරයෙන් ප්‍රකාශයට පත් කරන ඩී. ඇම්. ද ෂෙඩ්. වික්‍රමසිංහ එහි **''සිරි සඟ් බොය් අබහය් මහරජ්හු''** වූ කලි වෙස්සගිරි II පුවරු ලිපියෙහි **සිරිසඟ්බෝ් අභා මිහින්දු''** බවත් ඔහු ම IV. මිහිඳු බවත් කියමින් මුල් මතය තහවුරු කරයි[12]. එහි ම පියා ලෙස සඳහන් **''අබහය් සලමෙවන්''** රජු ඇටවීරගොල්ලෑව ලිපියේ[13] එ ලෙස ද, ඇල්ලෙවැව ලිපියේ **''අබා සලමෙවන් දපුළු**[14] යයි ද,, කියැවෙන V. [U.H.C. IV.[15]] දප්පුල බවත් පෙන්වා දෙයි. ඔහු V. කාශ්‍යප ගේ සොහොවුරා මෙන් ම II. සේන මහරජුගේ පුතා බවත් තව දුරටත් පැහැදිලි කරයි[16]. එසේ ම වික්‍රමසිංහ රුහුණේ මයිලගස්තොට ලිපිය හඳුන්වා දෙමින් මෙසේ ලියයි.

''**V. කාශ්‍යප මහරජු ගේ සහෝදර V. [UHC–[V.] දප්පුල මහරජු ගේ පුත්‍ර මිහිඳු රජු** රුහුණේ ඈපා තනතුර දැරූ අවධියේ එය පිහිටුවන ලද බව[17] යි,'' යනුවෙනි. මේ හැර කිරින්ද රණකෙළිය ටැම් ලිපියත්[18], මාමඩල අසල බෝලානෙන් සොයාගත් ලිපියත්[19] පිහිටුවා ඇත්තේ ඈපා මිහිඳු නම් එක් අයකු විසිනි. මේ ලිපි තුනෙහි ම ඈපා මිහිඳු තම පියා ලෙස දක්වා ඇත්තේ ''දෙබිසෙව්හි ද අභා සලමෙවන් මහ රද්හු මුරෙහිද[20]'' ඇ විසින් ''දෙබිසෙව් ජා/ද අබා සලමෙවන්'' නමින් හඳුන්වා ඇති එක ම තැනැත්තා වන V. කාශ්‍යප රජතුමා ය. ඒ බව මෙහිලා වික්‍රමසිංහ ගේ අවධානයට යොමු වී නැත.

---

10. Ceylon Sessional Papers (C.S.P.) xi, 1876, pp. 7-10
11. Ancient Inscriptions in Ceylon (A.I.C), E. Müller, 1883, p, 37 No. 120.
12. E 2. Vol, i Plate No. 9, 1-6 & p. 30
13. AIC. No. 117 p. 56
14. AIC. No. 116 p. 56
15. කලින් පිළියෙල වූ රාජ නාමාවලී ලැයිස්තුවල ''දප්පුල-ii'' යනුවෙන් නම් කළ රජු UHC. Vol. i-i නාමාවලියට'' උදය-i'' යනුවෙන් නම් කෙරුණු නිසා මේ වෙනස ඇතිවිය.
16. E 2. Vol. ii, p. 58
    v. කාශ්‍යප ii. සේනගේ පුතා (චූව.) 49-9-12 සහ 18-20) බව සියලු මූලාශ්‍රයවල එයි. ඒ. වී. සුරවීර ගේ රාජාවලී නිබන්ධනයේ රාජනාමාවලි සංසන්දන වාටයෙහි පමණක් v. කාශ්‍යප රජතුමා ii. සේන රජතුමා ගේ මල්ලී යයි අංක 117 දක්වන්නේ ප්‍රමාදයකින් විය යුතු ය. (රාජාවලිය,- ඒ. වී. සුරවීර, 1976. අංක 120 පට 113)
17. E 2. Vol. ii, p. 58
18. E 2. Vol v, Plate 3?, 1–23
19. Archaeological Survey of Ceylon, Annual Repoıt [A.S.C], 1934, p. 19
20. E 2. Vol. v. Plate 32; 11–14; E 2. Vol. vi, Plate No. 07, 11–14; [දෙ] බිසො රැද්න කුස්හි උපන් අභාසලමෙවන් මහරද්හු. . . .''

ජේතවන නමින් ශිලා ලේඛන සංග්‍රහයෙහි මුද්‍රිත අභයගිරි පුවරු ලිපියෙහි ලා වික්‍රමසිංහ මුල් මතය මදක් වෙනස් කරයි. ලිපියෙහි ''මිති මහරජ්හු මිණී මෙවුලා මහ පහා කරවූ'' වගත් මහාවංස (=චූලවංස) යෙහි මණිමේඛල ප්‍රාසාදය II.සේන රජු කළ වගත් සසඳ, මේ සෙල් ලිපියේ ''සිරි සඟ් බෝ අබා මහරජ්'' (නම් වූ. IV. මිහිඳු) ගේ ''මිති මහරජ්'' (=මුත්තා) II. සේන ලෙස නිවැරදිව හැඳිනගනී. එහෙත් වික්‍රමසිංහ පිතෘත්වය සැකයට භාජන කරමින් '' **II. සේන ගේ පුත්‍රයන් වන V. කාශ්‍යප හා V. [IV.] දප්පුල දෙදෙනා ගෙන් එක් අයකු IV. මහින්ද ගේ පියා විය යුතුය**[21] යි දෙවන වරට වෛකල්පික මතයක් ඉදිරිපත් කර ඇත. මේ ලිපියෙහි ම IV. මහිඳු තම බෑ රදහු විසින් අඩාළව කළ හුලිගම් වෙහෙර[22] ගැන සඳහන් කොට ඇත. එය IV. සේන රජු තමා කුඩා කල විසූ සිත්ථගාමයේ කළ එනම් පිරුවන[23] ලෙස වික්‍රමසිංහ හැඳින ගෙන ඇත. එහෙයින් ''IV. **සේන සහ IV. මහින්ද යන රජුන් දෙදෙනා V. කාශ්‍යප ගේ හෝ V. [IV.] දප්පුල ගේ පුත්‍රයෝ ය**'' යි තව දුරටත් වික්‍රමසිංහ එහි පෙන්වා දෙයි.

චූලවංසයෙහි 22 වන පරිච්ඡේදයෙහි ගාථා **පණසකින් පමණ**, සිංහල ඉතිහාසයෙහි විශිෂ්ට තැනක් ගන්නා මේ මහාවීරයා පිළිබඳව ආගමික අතින් වැදගත් වූ කරුණු රැසක් දක්වා ඇතත්, එතුමා ගේ මව්පිය පරපුර ආදී පෞද්ගලික ජීවිතය හා සම්බන්ධ වැදගත් තොරතුරු කිසිවක් එයට ඇතුළත් කොට නැත. ඔහුට පළමු රජකළ ඔහු ගේ සොහොවුරා [-බෑ] යයි ජේතවන (අභයගිරි) ලිපියෙහි සඳහන් IV. සේන (954–956) රජු ක්‍රමාගත රාජාභිෂෙකයට පත්වූ බව හා එම රාජෝදයේ දී ආදිපාද වූ මෙම මහිඳුට යුවරජ තනතුර හිමිවූ බව පමණක් චූලවංසය[24] සඳහන් කරයි.

I. සේන පටන් V. කාශ්‍යප තෙක් රජ කළ II. සේන, II. උදය, IV. කාශ්‍යප යන රජුන් තිදෙනා සොහොවුරන්[25] බවත් ඉන් V. කාශ්‍යප II. සේන ගේ පුතා[26] බවත් චූ.ව. පැහැදිලිව සඳහන් කරයි. V. කාශ්‍යප හා (III. දප්පුල නමින් අනතුරුව රජ වූ) යුව රජුත් අතර සම්බන්ධය චූ.ව. දක්වන්නේ තමා ගේ වංශයෙහි උපන් (''නරින්දො සො වංසෙ ජාතස්ස අත්තනො''[27]) යනුවෙනි. කලින් චූ.ව. දක්වා ඇති අයුරු (''කනිට්ඨං'' සක භාතරං'' ආ විසින්) නො වේ.

මෙසේ ම, III. දප්පුල, IV. දප්පුල, III. උදය, III. සේන, IV. උදය IV. සේන සහ IV. මහිඳු යන අනුපිළිවෙළ සෙ රජ පත් මේ සත් රජුන් ගේ පිතෘත්වය හෝ අන්‍යෝන්‍ය ඥාතිත්වය චූ.ව. නො දක්වයි. මහිඳුට පළමු රජ පත් IV. සේන ගැන චූ.ව. දක්වන්නේ

---

21. E 2. Vol. i, p. 214
22. ibid, Plate 28, 1-27 ''බෑ මහරද්හු අඩාළා කළ හුලිගම් වෙහෙර් කරා''
23. ම.ව. 52-06 ''පරිවෙණං සිත්ථගාමං කාරෙත්වා වුත්ථමත්තනා....''
24. ම.ව. 52. 1-2.
25. ම.ව. 49-63 ''අථ රාජා මතෙ තස්මිං කණිට්ඨමුදයං තථා ''
    49.91 ''කණිට්ඨං සක භාතරං ......කස්සප නාමිකං ''
26. මව. 49.9-12
27. මව. 50.42

ඔහු ක්‍රමාගත ලංකාභිෂේකයට පත් වූ බව පමණකි[28]. තමා රජ ව මිහිඳු ඈපා යුවරජ පදවියට පත්කරගත් බව[29] කීසක් මුද්‍රිත ජේතවන නමින් වූ අභයගිරි ලිපිය[30] සඳහන් කරන දෙදෙනා ගේ භ්‍රාතෘත්වය වත් චූලවංසයෙන් ප්‍රකාශ නො වේ.

වික්‍රමසිංහ දක්වන අයුරු මේ දෙ රජුන් (IV. සේන සහ IV. මහින්ද) ගේ පියා V. කාශ්‍යප හෝ IV. දප්පුල යයි නිගමනය කළ හැකි සෘජු ප්‍රකාශයක් හෝ සාධකයක් හෝ සොයා ගත නොහැකි ය. මේ ලෙඛනවල බොහෝ රජුන් හඳුන්වාගෙන ඇත්තේ කස්සප, දප්පුල ඈ පෞද්ගලික නම්වලින් නො ව, රාජාභිෂෙකයේ සිට ලැබෙන සිරිසඟබෝ, අභාසලමෙවන් යන පොදු රාජ විරුද නාම දෙකින් එකක් මාරුවට යොද ගැනීමෙනි[31]. එ හෙයින් මේ දෙ රජුන් ගේ පිතෘත්වය චූලවංසය තුළින් සොයා බැලීමේ එක ම මාර්ගය VI. සේන ලත්හ යි කී මේ ක්‍රමාගත ලංකාභිෂෙකය විමසීම යි.

ලංකාවේ විශේෂයෙන් අනුරාධපුර මහරජය ආදියෙහි පැවත ආ අයුරු ක්‍රමාගත අභිෂෙකය භාරතයේ හෝ රෝහණයේ මෙන් පිය පුත් ක්‍රමය මත පදනම් වූවක් නො වී ය. විල්හෙල්ම් ගයිගර් ආදී බොහෝ දෙනකු පෙන්වා දී ඇති පරිදි දෙටු සොහොවුරා ගේ පටන් කනිටු සොහොවුරා තෙක් ද ඉන් පසු හෝ එසේ නැති විට හෝ වැඩි මහල් පිළිවෙළින් ම ඔවුන්ගේ පුතුන් අතර ද රාජාභිෂෙකය සඳහා හිමිකම් ලැබීම යි[32]. මේ අනුව IV. සේන සහ IV. මහින්ද දෙදෙනා කා ගේ පුතුන් දැ යි සෙවීම එතරම් ම දුෂ්කර නො වේ. එබඳු තර්ක විතර්ක නිගමන වුව ද, ඓතිහාසික සත්‍යයන් බවට තහවුරු වීමට නම් වෙනත් අභිලෙඛනගත සාක්ෂ්‍ය ද ඉදිරිපත් කළ හැකි විය යුතු ය.

එහෙත් විධිමත් විමසීමකට තරම් කරුණු පැහැදිලි නොවූ කලක වික්‍රමසිංහ දෙවනුව දක්වූ වෛකල්පික මතයක එක් අංශයක් වූයේ මේ දෙරජුන් ගේ පියා V. කාශ්‍යප මහ රජතුමා ය යන්න යි. එය බොහෝ ඉතිහාස විශෙෂඥයන් හා පර්යේෂකයන් අද තෙක් ම ගෙන ඒම පුදුම සහගතත ය.

''මෙසේ IV. උදය ගේ ඇවෑමෙන් V. කාශ්‍යප ගේ පුත්‍රයන් වූ IV. සේන සහ IV. මහින්ද රජ වූහ''[33] යි දැක්වීමෙන් විල්හෙල්ම් ගයිගර් ද V. කාශ්‍යප ගේ පිතෘත්වය පිළිගෙන තිබේ. ඇම්. බී. ආරියපාල ද ''සිංහල රජුන් ගේ රාජ්‍ය උරුමය'' යන ලිපියෙහි ලා දක්වන්නේ ද V. කාශ්‍යප ගේ පිතෘත්වය යි[34]. සෙනරත් පරණවිතාන ගේ උපදේශකත්වය යටතේ සංස්කරණය කළ උපාධි නිබන්ධනයේ රාජ නාමාවලී සංසන්දන වාටයෙහි ලා ඒ. වී. සුරවීර පිළිගෙන ඇත්තේ IV. සේන හා IV. මහින්ද දෙ රජුන් ම V. කාශ්‍යප ගේ පුත්‍රයන් බව ය.[35]

---

28. මව. 52. 01 ''තතො ලංකාභිසෙකං සො පත්වා සෙනො කමාගතං''
ක්‍රමාගත අභිෂෙකය යනු රජු ගෙන් පසු ඔහු ගේ සොහොවුරන්ටත් සොහොවුරන් නැති විට රජු ගේ වැඩුමල් සොහොවුරා ගේ සිට සෙසු සොහොවුරන් ගේ පුතුන්ටත්, එසේත් නැති විට රජු ගේ පුතුන්ටත් වැඩි මහලු පිළිවෙළින් ලංකා රාජාභිෂෙකය ලැබීම යි.
29. මව. 52.01 ''මහින්දස්සාදිපාදස්ස යුවරාජ පදං අද''
30. E 2. i, Plate 28 1–27
31. Culavamsa (Tıanslation)–[CTr.]–Wilhelm Geiger, p. 83 fn. 44-82
32. Culture of Ceylon in Mediaevel Times, (CCMT.) p. 114 Social History of Early Ceylon H. Ellavala, PP. 90-94
අනුරාධපුර යුගයේ දී ලංකාවේ පැවති රාජ්‍ය උරුමය පිළිබඳ රීතිය (බුද්ධශ්‍රාවක සංග්‍රහය, 1974) රණවැල්ල 34-37 පිටු.
33. CCMT. p. 115 S. 106, මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය [මලංසං] (පරිව. ඇම්. බී. ආරියපාල) 186 පිට 106 ඡෙද
34. University of Ceylon Review (UCR.) xii, 4, p. 210
35. රාජාවලිය - ඒ. වී. සුරවීර සං. [රාසු. ]1976, 114 පිට අංක 126, 127

''චූලවංසයෙහි සක්ක සේනාපති ගේ මව වූ ''දෙවා රජින'' V. **කාශ්‍යප මහරජු** ගේ එක් බිසොවක් වූහ. V. මිහිඳු ද (ලේඛනගත වී නැතත්) ඇය ගේ **පුතකු විය යුතු** ය'' යි ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාස ග්‍රන්ථයේ ප්‍රථම කාණ්ඩ ප්‍රථම භාගයේ ලා **එල්. එස්. පෙරේරා** විසින් ද එය ම (.V **කාශ්‍යප** ගේ **පිතෘත්වය**) නිගමනය කරමින් දෙවා රජින පිළිබඳ නව සාධකයක් ද ඉදිරිපත් කොට ඇත[36]. IV. මිහිඳු පමණක් නොව, මහා කවි යයි චූලවංසයෙහි විරුදවලී ලත් IV. සේන රජු ද ගත්කතුවර V. කාශ්‍යප ගේ පුත්‍රයකු යයි යට දක්වුණු වියතුන් ගේ සම්මානනීය ලේඛනවල සටහන් වී ඇත.

එහි තව දුරටත් කරුණු දක්වන එල්. එස්. පෙරේරා ''IV. සේන ගේ පරම්පරා විස්තරය ඔහු ගෙන් පසු රජය හිමි වූ IV. මහින්ද හා ළඟින් බැඳී ඇතැයි ද, කලින් දක්වුණු පරිදි ඔහු (IV. මහින්ද) V. කාශ්‍යප ගේ පුත්‍රයකු ලෙස පිළිගෙන ඇතැයි ද, සඳහන් කරන අතර ම, IV. සේන IV. උදය ගේ සහෝදරයකු මෙන් ම, IV. කාශ්‍යප ගේ පුත්‍රයකු ද විය හැකි යයි ද, නොඑසේ නම්, (මේ IV. සේන) IV. මහින්ද ගේ සහෝදරයකු හා V. කාශ්‍යප ගේ පුත්‍රයකු විය හැකි යැයි ද[37] අනුමානයන් කීපයක් ම ඉදිරිපත් කරයි. මහාචාර්යවරයා (එල්. එස්. පෙරේරා) එහි ම ඊළඟ පිටුවෙහි දී මෙසේ ද කියයි.

''We could include as a possible father of Mahinda his predecessor Sena, IV.''[38]

IV. මහින්ද ගේ ''බෑ'' යයි අභයගිරි ලිපියෙහි පැහැදිලි ව ම සඳහන් කළ IV. සේන පවා IV. මහින්දට පෙර රජ වීම නිසා ඔහු ගේ පිය සංඛ්‍යාවෙහි ලා සලකමින් අනවශ්‍ය ව්‍යාකූලත්වයකට පත් කිරීමට හේතු වූයේ අනුරාධපුර රාජ්‍ය උරුමය පිළිබඳ අනවබෝධය විය හැකි ය. මෙයින් ද පෙනෙන පරිදි, වත්මන් ඉතිහාස විශාරදයන් විසින් මේ යුගයේ ඉතිහාසය තව තවත් ව්‍යාකූල කොට ඇති අන්දම අපේ අවධානයට ලක් විය යුතු ය. මෙයට තවත් සාධකයකි, මේ. චූලවංසයෙහි[39] ඉතා පැහැදිලි ලෙස ''මාමා/මාතුල'' යයි කියවෙන IV. උදය රජු පවා මොහු විසින් IV. මිහිඳු ගේ පියා ලෙස සැක කළ බවට

Thus we exclude the possibility of Udaya IV. being the father of Mahinda IV''[48] යන ඔහු ගේ මේ ප්‍රකාශය සාධක වෙයි.

මේ කීර්තිමත් ඉතිහාසඥයන් විසින් V. කාශ්‍යප IV. මහින්ද ගේ (සහ IV. සේන ගේ ද) පියා ලෙස ගැනීමට පෙළඹවූ ප්‍රධාන සාධක තෝරා ඒවා විමසා බැලීම නව නිගමනයකට පෙර කළ යුතු වෙයි.

(අ) මහින්ද ගේ මව ''දෙව් ගොන්' යයි ඇතැම් සෙල් ලිපිවල සඳහන් වීමත්, V. කාශ්‍යපට 'දේවා' නමින් බිසොවක[41] සිටි බව චූලවංසයේ සඳහන් වීමත් අනුව මේ දේවා සහ දෙව් ගොන් දෙදෙනා එක් අයකු සේ ගෙන IV. මහින්ද මේ (දේවා/දෙව්ගොන්) දෙ දෙනා ගේ පුත්‍රයෙකි යි නිගමන කිරීම එකකි.

---

36. UHC i-i, p. 339
37. Ibid p. 338
38. Idid. p. 339
39. මව. 52.48 ''මාතුලොදය රාජෙන .............''
40. UHC. i-i, p.339
41. මව. 50. 64

එහෙත් මේ දේවාට සක්ක සේනාපති හැර V. කාශ්‍යප ගෙන් අන් පුතකු වූ බවට කිසිදු මූලාශ්‍රයක් නැතැයි ද පිළිගන්නා එල්. එස්. පෙරේරා කිසිදු මූලාශ්‍රයක් නැතිව ම IV. මහින්ද ද ඇය ගේ පුතකු විය හැකිය යි පිළිගන්නේ වික්‍රමසිංහ ගෙන් පටන් ගත් සම්ප්‍රදාය ද රැකීමට යි .

චූලවංශයෙහි V. කාශ්‍යප රජෝදය දක්වෙන කොටසෙහි[42] එම රජු ගේ බිසෝවරුන් හා පුතුන් ගැන මේ තොරතුරු ඇත.

''සක්ක සෙනාපතිට්ඨානං දත්වා පුත්තස්ස අත්තනො ''(50-53)

''භරියා වජිරා තස්ස තෙසංයෙව අදපයි'' (50-62)

''සක්ක සෙනාපතී මාතා දෙවා රඤ්ඤක භික්ඛුනං'' (50-64)

''පූජෙසි රාජිනී නාම රාජිනො භරියා පරා'' (50-67)

''තස්සා පුත්තො සි සිද්ධත්ථො නාම ඉස්සරියෙ ඨිතො'' (50-68)

V. කාශ්‍යප ගේ රාජ්‍යෝදය දක්වන මේ කොටසෙහි පමණක් ඔහු ගේ බිසෝවරුන් තුන් දෙනෙක් දේවා, රාජිනී, සහ වජිරා (මැය සක්ක සේනාපති ගේ භාර්යාවක් යයි සැක උපදින සේ ගාථාවෙහි යෙදී ඇත.) යනුවෙන් සඳහන් වෙති. දේවා ගේ පුතා, සක්ක සේනාපති විය. (''සක්ක සේනාපතී මාතා'' යනුවෙන් හැඟෙන්නේ ඇය ගේ පුතා ඔහු ම පමණක් බව ය.) රාජිනිය ගේ පුතා ''සිද්ධත්ථ'' (පරණවිතාන[43] ''සිද්ධ යාත්‍ර'') නමි. වජිරා (V. කාශ්‍යප බිසොවක් වූ නම්) දරුවන් නැත්තක සේ ද පෙනේ. කළුදිය පොකුණ ලිපියෙහි[44] ''මහ සෙන් මහරජ්'''' නම් වූ IV. සේන ගේ මව විදුරා නම් රැජිනක වුවත්, චූලවංශයෙහි ''භරියා'' ''ඔරොධා'' යනුවෙන් හැඳින්වෙන්නී සාමාන්‍ය දෝළියක මිස රැජිනක නො වෙතියි පරණවිතාන සිතයි.[45] එහෙත් බ්‍රාහ්මී යුගයේ රජ බිසොවුන් ''පරුමක බරිය''[46] යනුවෙන් හැඳින්වුණා සේ ම, වජිරා පමණක් නොව රාජිනී බිසොව ද මෙහි හැඳින්වුණේ භරියා (රාජිනො භරියා පරා) යනුවෙනි. මෙහි 'දේවා' අග මෙහෙසිය (ගොන්) වූ හෙයින් අනෙක් වජිරා සහ රාජිනී දෙදෙනා දෙවැනි බිසොවුන් වුණා විය හැකි ය.

සක්ක සේනාපති පණ්ඩු රජු වෙනුවෙන් සොළී යුදට ගොස් වසංගතයෙන් මළ නිසා එම තනතුර පිය රජු යළිත් පිරිනමන ලද්දේ ඔහු පුත් තම මුනුබුරාට ය.[47] අනෙක් පුතා සිද්ධත්ථ මළ විට ඔහු නමින් ශාලාවක් තනවා දන්වැට තබා පින් දෙන ලදහ යි කියවේ.[48] V. කාශ්‍යප මහ රජු ගේ අභාවයෙන් අනතුරුව අභිෂේක ලත් (III) දප්පුල යුවරජු ගැන පෙර සෙසු තන්හි දී මෙන් ''අත්තනො පුත්තං'' ''සකභාතරං'' යනුවක් නො කියා ''වංසෙ ජාතස්ස අත්තනො''[49] යනුවෙන් හඳුන්වා දීමෙන් ද සනාථ වන්නේ V. කාශ්‍යපට සක්ක සේනාපති සහ සිද්ධත්ථ හැරුණු විට (අභිෂේක ලාභයට හෝ සුදුසු ) වෙනත් පුත්‍රයකු අනුරාධපුර රජය තුළ නොවූ බව යි.

42. මව. 50. 37.
43. Ceylon and Malaysia - (C.M.) S. Paranavitana, 1966 pp. 24-25
44. E.Z. Vol. i, pp. 182-190
45. EZ. Vol. III, pp. 262-263
46. UCR. Vol. viii, p. 122
47. මව. 51. 77-79
48. මව. 51.68-69
49. මව. 50.42
''භූමි චන්දෙ නරින්දෝ සො වංසෙ ජාතස්ස අත්තනො
දප්පුලස්සා දිපාදස්ස යුවරාජ පදං අද''

මේ යුගයේ දි තිස්සා, දේවා, විදුරා, සංඝා. කිත්තා, නාලා ආදී පොදු බිසෝ නම් පෙළක් ද පරපුරෙන් පරපුරට පැවත ආ බව පෙනේ. I. උදය ගේ දුව වූ ද, රුහුණේ දයාසිව පුත් මහින්ද ගේ බිසොවවූ ද කුමරියක් 'දේවා' නම් වූ[50]. II. දප්පුල ගේ දුව වූද රුහුණේ කිත්තග්ගබොධි ගේ භාර්යාව වූ ද තවත් කුමරියක් ''දේවා'' නම් වූ[51]. IV. දප්පුල රජු ගේ බිසොවක් ද ''දෙව්ගොන්'' වූහ.[52] III. උදය රජුගේ බිසොවක් ද ''දෙව්ගොන්'' වූහ.[53] එසේම සක්ක සේනාපති ගේ මව වූ ද V. කාශ්‍යප රජුගේ එක් බිසොවක් ද ''දේවා'' නම් වූවා ය.[54] විශේෂ සිද්ධියක් හා සම්බන්ධව මෙසේ මහාවංසයේ හා සෙල් ලිපිවල නම් කරන ලද බිසෝවරුන් ටික දෙනකු අතර පවා දේවා නමින් හැඳින්වුණු කීප දෙනකුම සටහන්ව තිබේ. එහෙයින්, දේවා නම දුටු පමණින් ඇය V. කාශ්‍යප ගේ දේවා බිසොව ය යි හැඳින්වීම අයොග්‍ය ය. එසේ ම, ලේඛනගත කිසිදු මූලාශ්‍රයක් නැතිව, මේ දේවාට මහින්ද නමින් පුතකු සිටීමට බාධාවක් නැතැයි හුදු කල්පනා මාත්‍රයක් මත ඓතිහාසික නිගමනයක් ගොඩ නැගීම ද යුක්තිසහගත නො වේ.

(ආ) ඒ සමඟ ම, මේ යුගයේ සෙල් ලිපිවල බොහෝ සෙයින් ම රජුන ගේ නම් දක්වා ඇත්තේ **අබාසලමෙවන්** හෝ **සිරිසඟබෝ** යන අභිෂෙක විරුද නාම දෙක මාරුවෙන් මාරුවට භාවිත කිරීමෙනි.[55] එසේ ම එක ළඟ අභිෂෙක ලත් මේ රජවරු ද අග්බෝ, මහින්ද, සේන, කාශ්‍යප උදය, දප්පුල යන ආදී පුද්ගල නාම කීපයකට සීමා වූවෝ ය. මේ එක් නමකින් සමහර විට හත් අට දෙනා හඳුන්වන ලදහ. මේ සමානත්වයන් විසින් පර්යේෂකයා දුක්මනින් නොමඟ යැවීමට ඉඩ තිබේ. මෙහි දී ද සිදු වී ඇත්තේ එය යි.

IV. මහින්ද ගේ පියා විය යුතු යයි වික්‍රමසිංහ සැලකූ IV. දප්පුල සහ V. කාශ්‍යප දෙදෙනා ද 'අබා සලමෙවන්'ය. එල්. එස්. පෙරේරා පියා වීමට සුදුසු යයි සැලකූ IV. සේන ද අබා සලමෙවන් ය. මේ හැර මේ ටික කාල පරිච්ඡේදයට අයත් I. සේන, II. උදය, සහ III. සේන ද අබාසලමෙවන් ය. ඊින් V. කසුප් අබාසලමෙවන් රජු IV. මිහිඳු ගේ පියා ය යි බොහෝ දෙන යට දැක්වූ පරිදි දැඩි ව පිළිගැනීමට හේතුව ඔහු ද අබාසලමෙවන් වීමත් ඔහුට ද දේවා නමින් බිසොවක සිටීමත් පමණක් ම නො වේ.

(ඉ) V. කාශ්‍යප රජු සිය පියා වූ II. සේන මහරජු ගේ කාලයෙහි යුවරජකු ව සිටිය දී පියා විසින් ම විවාහ කොට දුන් සංඝා නම් කුමරිය[56] ගෙන් උපන්, පසුව රුහුණේ ඈපා තනතුර දැරූ ප්‍රතාපවත් මහින්ද නම් පුත් කුමරකු සිටීම ද, IV. මහින්ද රජුට V. කාශ්‍යප ගේ පීතෘත්වය පැවරීමට ප්‍රබල හේතුවක් විය. මේ අනුව අනුරපුර සොළොස් වසක් රජ කළ මහින්ද මහරජතුමාත්, ජීවිතාන්තය තෙක් රුහුණේ ඈපාව සිටි ඈපා මිහිඳුත් V. කාශ්‍යප රජු ගේ එක් පුතකු ලෙස මෙ විශාරදයන්ට සැලකීමට සිදු වූ බව පෙනේ.

රුහුණේ ඈපා මිහිඳු II. උදය රජු සමයෙහි සිට V. කාශ්‍යප පිය රජුගේ රාජ්‍ය කාලය ද ඉක්මවා (දුන් පසුවත්) අවුරුදු හතළිහක් (887 - 930) පමණ රුහුණේ පාලකයා ව සිටි බව ඔහු ගේ මයිලගස් තොට, බෝලාන සහ කිරින්ද- රණකෙළිය යන සෙල්ලිපිවල එන

---

50. මව. 47.12 ''තෙන මෙත්තං ථිරං කාතුං ධීතරං දෙවනාමිකං''
51. මව. 47.72 ''සබ්බ රූප ගුණො පෙතං ධීතරං දෙවනාමිකං''
52. EZ. Vol v. (i), p. 126 (Kondavattavan), EZ. Vol. iii, (Aturupolayagama) pp. 384-5 EZ. Vol, i, pp. 24-26
53. EZ. Vol. iii, p. 222 (Detagamuva)
54. මව. 50.64 ''සක්ක සෙනාපතී මාතා දේවා ......................''
55. C.Tr. p. 83, tn 44-82.
56. මව. 49.18

රාජ වර්ෂ ආදී අඩංගු තොරතුරුවලින් අනාවරණය වේ. සෙල් ලිපි සාධක විරල වූ ද නොපැහැදිලි වූ ද, මුල් කාලයේ දී IV. මිහිඳු මහරජු V. කාශ්‍යප නිරිඳුන් ගේ පුත්‍රයකු සේ වරදවා නිගමනය කිරීමට වික්‍රමසිංහත්, ඔහුට පෙර සිටි එඩ්වඩ් මියුලර් සහ ගෝල්ඩ්ස්මිත්[57] ආදීනුත් පෙළඹවූ තවත් හේතුවකි, මහින්ද යන නාමේ සමානත්වය.

(ඊ) IV. මහින්ද රජතුමා ඔහු ගේ සෙල් ලිපි රාශියක ම සිය මව ලෙස සඳහන් කරන්නේ **දේවා (-දෙව්ගොන්)** බිසොව ය. එහෙත් රුහුණේ ඇපා මිහිඳු රණකෙළිය ඈ සිය ලිපිවල තම මව ලෙස සටහන් කොට ඇත්තේ ඇය නොව "**සඟ ගොන්**" (සංඝා) නම් බිසොවක් ය. ඒ නිසා මේ මිහිඳුවරුන් දෙ දෙනා එක් අයකු විය නොහැකි ය. V. කාශ්‍යප ගේ එක් බිසොවක වූ සංඝා ගෙන් රුහුණේ ඇපා වූ මහින්දත් එල්. එස්. පෙරේරා (ලංකා විශ්ව විද්‍යාලය ලංකා ඉතිහාස ප්‍රථම භාග ප්‍රථම කාණ්ඩයේ ලා) සඳහන් කළ අයුරු රජු ගේ ම තවත් බිසොවක වූ සක්ක සේනාපති මව් වූ 'දෙවා' ගෙන් රජය හිමි මහින්ද යන එක ම නමක් ඇති තවත් පුත් කුමරෙකුත් යන මහින්ද ලා දෙ දෙනකු ම V. කාශ්‍යපට පුතුන් වූ හ යි කෙසේ සිතන් ට ද? ඇරත් සක්ක සේනාපති ගේ මව වූ දෙවා රැජිනට ඔහු හැර, මහින්ද නමින් හෝ වෙනත් නමකින් හෝ තවත් පුතකු වූ බවට කිසිදු සාධකයක් නැතැයි පෙරේරා ම පිළිගෙන ඇති හෙයිනි. (මේ දෙවාට "සක්ක සේනාපති මාතා"[58] ය යි චූලවංසයෙහි යොදන ලද ආකාරයෙන් ඔහු හැර අනෙක් පුතකු නොවූ බව ද හැඟේ.)

(උ) V. කාශ්‍යපට සිටි මිය ගිය සිද්ධත්ථ, සක්ක සේනාපති වැනි පුතුන් ගැන පවා බොහෝ විස්තර තොරතුරු කියන චූලවංස කතුවරයා ලක් රජය හිමි අනුරපුර රජයෙහි අවසන් වරට ලක එක සේසත් කළ, ලංකාව ආක්‍රමණය කළ විදේශීය මහාධිරාජ්‍යයන් දෙකක් ම තම පාමුල දණ ගැස්වූ මහා ප්‍රතාපවත් IV. මහින්ද වැනි පුතකු (V. කාශ්‍යපට) සිටියා නම්, ඒ බව විශේෂයෙන් ම වංශ කථාගත කරනු නොඅනුමාන ය. එසේ නොවීම ද මේ සම්මතයට එරෙහි ව නැඟී සිටී.

මෙසේ ම, රුහුණේ ඇපා මිහිඳුත් IV. මිහිඳු රජුත් එක් අයකු සේ ගෙන, ඇපා මිහිඳුගේ පියා වූ දෙබිසෙව ජා අබා සලමෙවන්' (V. කාශ්‍යප) රජු IV. මහින්ද මහරජු ගේත් පියා යැයි ගැනීමට ඉඩ නොදෙන ප්‍රබල බාධකයකි, මහින්දලා දෙදෙනා අතර වූ කාලයේ පරතරය.

(ඌ) චූලවංසය අනුව මදුරාව (Madurai) යටත් කළ සිංහල නරේන්ද්‍රයකු වූ[59] II. සේන (853-887) රජු දවස ඔහු ගේ මල්ලී වූ අර්බුදකාරී මහින්ද උපරාජයන්ටත්, බිරිය වූ තිස්සාටත් ලැබුණු දුව, සංඝා II. සේන රජු විසින් ම තම පුතා වූ කස්සප යුවරජුට පාවා දෙන ලද්දු ය. මේ දෙදෙනාට උපන් පුතා රුහුණේ ඇපා මිහිඳු ය. II. සේනට අනතුරුව රජ පත් II. උදය රජු (887-898) දවස (මහින්ද උපරාජ සහ කිත්තා දෙදෙනා ගේ පුත්) කිත්තග්ගබොධි ගේ රුහුණේ කැරැල්ල මැඩ ලීමට සියලු අතින් සුදුස්සා ලෙස සලකන ලද්දේ, මේ ඇපා මිහිඳු ය. II. උදය රජු ඇපා මිහිඳු ගේ පියා වූ කස්සප යුවරජුට පුතා ගැන කියන්නේ මේ ය

---

57. අධොලිපි අංක 10, 11
58. මව. 50.64
59. EZ. Vol.v, p.28

"ඔබේ පුතා මහින්ද වියපත් ය. මහ බලවත් ය. මව්පිය දෙපසින් ම රුහුණට හිමිකම් ඇත. ශූර ය, වීර ය, යුද පුහුණු ය. යුද්ධ යෝග්‍ය ය. නැණවත් ය. නිපුණ ය, කලා කුශලතා ඇත. ඔහු යවා මාමා මැරුවහු (=කිත්තග්ගබෝධි) හිරභාරයට ගන්න.[60]"

යුද වැද කිත්තග්ගබෝධි අල්ලා අනුරපුර එවූ ඇපා මිහිඳු එද සිට රෝහණාධිපති ආදිපාද තනතුරට පත්විය[61]. අනතුරු ව IV. කාශ්‍යප (898 - 914) රජයේ දී රෝහණාධිපති ඇපා මිහිඳු අනුරපුර රජය පවා ආක්‍රමණය කෙළෙන් ඊ තියට පත් රජු ඇපා මිහිඳු ගේ පියා වූ ද තමා ගේ උපරාජ වූ ද කාශ්‍යප ලවා පුතාට කරුණු කියවා' සමගි සන්ධානයට පත් විය.[62] එහෙත් ඇපා මිහිඳු තම ආක්‍රමණකාරී කටයුතුවලට එකඟ නො වූ මණ්ඩලාධිපතීන් නසන්නට වීම නිසා ජනතාව කුපිත වත් ම රජ සිය දියණියන් ද පාවා දී ඔහු රුහුණට ම යැවී ය.[63]

ඇපා මිහිඳු ගේ කිරින්ද රණකෙළිය ලිපියෙහි එන "සිය වික්මෙන් එක් පැහැර රු [හුණු] මල මඬලු තමා විසිකළ" [64] යන්න යට දක්වුණු මහාවංස ප්‍රකාශය හා සාකල්‍යයෙන් ම ගැළපේ.

මින් පසුව, IV. දප්පුල රජු (924 - 935) ගේ සවන අවුරුද්දේ පිහිටුවන ලද ලමැනි මිහිඳු ගේ දෙටගමුව සෙල්ලිපිය අනුව ඒ වන විට රුහුණේ අසහාය පාලකයා ව සිටි ඇපා මිහිඳු මියගොස් ඇති බව පෙනේ.[65]

IV. දප්පුල ගේ සවන අවුරුද්ද වන්නේ ක්‍රි. 930 ය. ඇපා මිහිඳු රෝහණාධිපති වූයේ II. උදය රාජ්‍යොදයේ දී හෙවත් ක්‍රි. 887 න් පසු ය.[66] මේ අනුව II. උදය, IV. කාශ්‍යප, V. කාශ්‍යප, II, දප්පුල සහ IV. දප්පුල ගේ සවන වර්ෂය තෙක් අතරතුර (අනුරපුර රජුන් පස් දෙනකු ගේ රාජ්‍යොදයන් තුළ) සතළිස් වසක් පමණ ඔහු රුහුණේ ඇපා සහ පසුව අනුරපුර පාලනය නොපිළිගත් නිදහස් පාලකයකු වශයෙන් ද සිට මිය ගොස් ඇත.

II. උදය රජු විසින් රෝහණ කැරැල්ල මැඬලීම සඳහා තරුණ මහින්දට ඇතැයි කී සුදුසුකම් අතර ඔහු "වුද්ධිප්පත්ත (=වැඩිවිය පත් වූවෙක්) විය; "මහබ්බල" "මහ බලවතෙක් විය; "කතූපාසන" (මනා යුද පුහුණුව ලද්දෙක්) විය. "නය කෝවිද" (රාජ නීතිය හසළ නීති විශාරදයෙක්) විය.[67] මේ සුදුසුකම්වලින් හැඟෙන්නේ උඩින් දක්වූ පරිදි මහින්ද ක්‍රි.ව. 887 වන විට අඩුම වශයෙන් පස් විසි විය වත් ඉක්මවූවකු වූ බව යි. එවිට ඔහු ගේ ජීවන කාලය ලෙස ක්‍රි.ව. 862 – 930 තෙක් වූ හැට අට වස දළ වශයෙන් ගිණිය හැකි ය.

---

60. මව. 49.98-101
61. මව. 49. 100-101
62. මව. 50.4-7
63. මව. 58. 8-9
64. EZ. Vol. v, Plate 32, B. 16-17
65. E.Z. Vol. iii, Plate 24, B.17-18
66. මව. 49. 119 "සයං සෙනං සමාදය මහාගාමමුපාගතො
රෝහණාධිපතී හුත්වා කරොන්තෝ ලොක සංගහං"
UHC i–i p. 145.
67. මව. 49. 99-101

එහෙත් අනුරපුර මහරජු වූ IV. මිහිඳු ගේ රාජ්‍ය කාලය ලෙස පිළිගෙන ඇත්තේ 956–972 අතර වූ සොළොස් වස යි.[68] V. කාශ්‍යප මහරජු ගේ දෙවු පුත් ඇපා මිහිඳුත් IV. මහින්ද මහරජුත් යට දැක්වූ විශාරදයන් ගේ පිළිගැනීම අනුව එක් අයකු වූව හොත් ඔහු වයස අවුරුදු එක සිය දසයකට ද වඩා වැඩි අද්භූත පුද්ගලයකු වනු ඇත.

මෙසේ දෙටගමුව ලිපිය අනුව IV. දප්පුල ගේ සවන වර්ෂය වූ ක්‍රි.ව. 930 වන විට ඇපා මිහිඳු මියගොස්, ඔහු වෙනුවට රුහුණේ නව පාලකයා ලෙස IV. දප්පුල මහරජු විසින් ලමැනි මිහිඳු පත් කොට සිටි බව සටහන් ව ඇත. එය "සැහැ කුලට තලා ටික්ව සිටි ලමැනි මිහින්දහු විසින්[69]" යන්නෙන් පෙනේ. මෙයිනුදු ප්‍රකාශ වන්නේ රුහුණේ ඇපා මිහිඳු කිත්තග්ගබෝධිට පසු රොහණාධිපති වූ බවත්, ඔහු ඇවෑමෙන් ලමැනි මිහිඳු IV, දපුළු යටතේ (පඳුව) 'තෙවන' රෝහණ පාලකයා වූ බවත් ය. මේ කරුණු සැලකීමේ දී 'මිහිඳු' යන නමින් මිස අන්කිසි අතකින් මේ දෙදෙනා එක් අයකු සේ සැලකිය නොහැකි බව ප්‍රකාශවේ. නම එකක් වුව ද, දෙමව්පිය පරපුර, ඉසුළු තනතුරු සහ කාලය ආදී හැම කරුණකින් ම වෙනස් ඓතිහාසික පුද්ගලයන් දෙදෙනකු බව යි, මෙයින් නිගමනය වන්නේ. මෙම සත්‍යය තේරුම් ගත් මුල් ම සෙල් ලිපි ප්‍රකාශකයා සෙනරත් පරණවිතාන බව ඔහු ගේ ප්‍රකාශයකින් හැඟේ.[70] IV. මිහිඳු රජු V. කාශ්‍යප ගේ පුත්‍රයකු කිරීමට ඉතිහාසඥයන් පෙළඹවූ ප්‍රධාන සාධක මෙසේ ගොණු කළ හැකි ය.

I. V. කාශ්‍යප රජුට දේවා [= දෙව් ගොන්] නමින් බිසොවක වීම

II. රජුට සංසා [= සංග්ගොන්] නම් බිසොව ගෙන් ලත් මහින්ද නම් පුතා රුහුණේ ඇපා වීම.

III. සංඝ්ගොන් නමින් සෙල් ලිපිගත ඇය ගේ නමේ මුල් (සංග්) කොටස නොපැහැදිලි වීම හා එය "සිටි" යයි ගෙන ඇය දෙව්ගොන් ලෙස වරදවා ගැනීම

IV. මිහිඳුවරුන් දෙදෙනා ගේ ම පියවරුන් 'අබාසලමෙවන්' ය යි ද සඳහන් වීම

V. මහින්දවරුන් දෙදෙනා ම මදක් සමකාලීන වීම

VI. IV. මිහිඳු ගේ පාලන කාලය සඳහන් ව ඇතත් ඇපා මිහිඳු ගේ පාලන කාලය නොපැහැදිලි වීම.

VII. රුහුණේ එක දිගට විසූ ඇපා මිහිඳු ගේත් ලමැනි මිහිඳුගේත් තොරතුරු අවිශද වීම.

VIII. මිහිඳු ගේ පරම්පරා විස්තර වංසකථාවල ඇතුළත් නොවීම.

IX. IV. මිහිඳු නමින් රජවූයේ ද රුහුණේ ඇපා මිහිඳු යයි යන කල්පනය

X. ක්‍රමාගත ලංකාභිෂෙකය ගැන අනවබොධය ආදිය යි.

මෙහි ප්‍රතිඵලය වූයේ මිහිඳුවරුන් දෙදෙනා එක් අයකු සේ සැලකීමත්, රුහුණේ ඇපා මිහිඳු ගේ පියා ලෙස සෙල් ලිපිවල සඳහන් "දෙබිසෙව ජා අබා සලමෙවන්" (V. කාශ්‍යප) රජු IV. මිහිඳු මහරජු ගේ පියා ය යි වැරදි නිගමනයකට එළඹීමත් ය.

---

68. UHC, i-ii, p. 102
69. EZ. Vol. iii, Plate 24, pp. 222-223
70. EZ. Vol. vi, p. 31
"a view that has held the ground for nearly a century and has almost acquired the sanctity of an Agama among "Scientific" historians."

''දෙබිසෙවජා/ද අබාසලමෙවන්'' යන විරුදයෙන් හැඳින්වෙන එක ම තැනැත්තා V. කාශ්‍යප රජතුමා ය. ඔහු ම ඇපා මිහිඳු ගේ පියා වූ බව මයිලගස්තොට ලිපියෙහි ''[දෙ] බිසො රද්න කුස්හි උපන් අභා සලමෙවන්'' [71] සහ කිරින්ද ලිපියෙහි ද ''දෙබිසෙව් ද අභා සලමෙවන්''[72] යනුවෙන් පෙනේ, ධම්පියා අටුවාවට කළ සන්‍නයේ කතුවරයා[73] හා සුළුකට අභයගිරි සෙල් ලිපියෙහි ප්‍රතිෂ්ඨාපකයා[74] ද මෙතුමා ය. චූලවංසය ''ද්වයාභිසෙක ජාතෙන ආදිපාදෙන සූනුනා[75]'' යනුවෙන් හැඳින්වූ අතර ඇපා මිහිඳු ගේ සෙල් ලිපි සියල්ලෙහි ම[76], මෙම විරුදය යොදා ඇත. එසේ ම ඔහු තම පියා ලෙස ද ඒවායේ සඳහන් කර ඇත.

එහෙත්. මිහිඳු රජතුමා ගේ යයි පිළිගනු ලබන සමහර ලිපිවල තම පියා 'අබා සලමෙවන්''[77] යනුවෙන් ද, සමහර ලිපිවල ''සිරිසඟබෝ අභා/බා'' යනුවෙන් ද එයි.

''සිරිසඟබෝ අබා මහරජ් හට් එ මැ කුලෙන් සමදූ දෙව්ගොන් බිසො රැජන කුසැ උපැද[78]'' යන්න ජේතවන නමින් පළ වී ඇති අභයගිරි පුවරු ලිපි අංක 1 හි පළ වී ඇත. ඔහු ගේ ම වෙවැල්කැටිය ලිපියෙහි

''සිරිසඟ්බො අභා මහරජහු පුත් සිරිසඟ්බො අභය් මහ රජ්හු සත් ලැගු''[79]

ඈ විසින් සෙල් ලිපි රාශියක ම සිය පියා හඳුන්වන්නේ ''සිරිසඟ්බො අබා මහරජ්හු'' යනුවෙනි. එක ද ලිපියක හෝ ''දෙබිසෙවජා අබා සලමෙවන්'' යනුවෙන් හඳුන්වා නැත. මෙයින් ද පෙනෙන්නේ ''දෙබිසෙවජා අභාසලමෙවන්'' ගේ පුත් රුහුණේ ඇපා මිහිඳුත් සිරිසඟබො අභා මහරජ් පුත් IV. මිහිඳුත් දෙදෙනකු බව යි.

(එ.) අනෙකක් තබා ජේතවන නමින් මුද්‍රිත අභයගිරි ලිපියෙහි IV. මිහිඳු රජතුමා විසින් V. කසුප් රජතුමා හඳුන්වා දෙන්නේ තම පියා ලෙස නො ව, ''මුත්තා'' (සීයා) හැටියට බව ඉතා පැහැදිලි ය.

''[28–29] මීති මහරද්හු ලියවන ලද් දහම් සඟන්[80]'' යනුවෙන් සිය මුත්තණුවන් වූ V. කාශ්‍යප රජතුමා අභිධර්ම පිටකයට අයත් ධම්මසංගනිය රන් පත්වල ලියවූ බව IV. මිහිඳු මහරජතුමා විසින් ම සිහිපත් කොට ඇත. චූලවංසයේ කීයේ මැනූ

''සොණ්ණ පට්ටෙ ලිඛාපෙත්වා භිධම්ම පිටකං තද
ධම්ම සංගනිකං පොත්ථං නානා රතන භූසිතං''[81]

---

71. EZ. Vol. vi-i, Plate-7, 11-12
72. EZ. Vol. v. Plate, 32-A, 11-12
73. ධම්පියා අටුවා ගැටපදය; හෙට්ටිආරච්චි සං. -1974,290 පිට
74. EZ. VOL. i. plate 12, 5-6
75. මව. 49.99-101
76. අධො ලිපි අංක 16, 17, 18.
77. EZ. Vol. i, (Jetavana Slab-Inscription (No. 2) of Mahinda IV.) pp. 230-237
78. EZ. Vpl. i, P. 218.2-3.
79. EZ. Vol. i, Plate 29, 3-4
80. EZ. Vol. i, Plate 28, 28-29
81, මව. 50.11

V. කාශ්‍යප පිළිබඳ මේ සිද්ධීන් ගැන වික්‍රමසිංහ මෙම අභයගිරි සෙල් ලිපියේ හැඳින්වීමේ ලා වටහා ගෙන ඇති[82] නමුදු, විස්තර උපුටා දක්වන නමුදු IV. මහින්ද රජු කාශ්‍යප රජු ගේ පුත්‍රයා ය. යන පූර්ව මතය රැකීමට දෝ V. කාශ්‍යප තම මුත්තා ය යන මහින්ද ගේ මේ වචන පවා විස්මෘත කරයි.

V. කාශ්‍යප මහරජු IV. මහින්ද රජු ගේ පියා ද මුත්තා ද යන්න නිගමනය කිරීමට ඔහු තම මුත්තා යයි කියන IV. මහින්ද රජු ගේ ම මේ වචන ප්‍රමාණවත් හෙයින් "IV. සේන සහ IV. මහින්ද දෙ රජුන් V. කාශ්‍යප පුත්‍රයන් ය" යි යන ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාස ප්‍රථම භාග ප්‍රථම කාණ්ඩය ඇතුළු සම්භාව්‍ය කෘති රාශියක දක්නා ලැබෙන සාවද්‍ය නිගමනය ගැන තව තවත් කරුණු දැක්වීම අනවශ්‍ය ය. IV. සේන සහ IV. මහින්ද දෙ දෙනා කාශ්‍යප පුත්‍රයන් නොවන බවට මේ ලිපියෙන් ප්‍රධාන වශයෙන් කරුණු ඉදිරිපත්කොට ඇති අතර IV. මහින්ද ගේ පියා විය යුතු බවට ඉතිහාසඥයන් සැක කොට ඇති IV. දප්පුල, III. උදය, IV, උදය හා IV. සේන ආදීන් ගැන ද මෙහි ලා කරුණු සාකච්ඡා කොට ඇත.

---

28. EZ. Vol. i, p.214.